(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 160.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 ජනවාරි මස 17 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0599/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ඉදිරි වර්ෂ 3 සඳහා,

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම වෙනුවෙන් සකස් කරන ලද ඉදිරි තරගවාර පිළිබඳ වැඩසටහන කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සංචාරය කිරීමට නියමිත රටවල් සහ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත රටවල නම් කවරේද;

(iii) ක්‍රීඩා කිරීමට නියමිත ටෙස්ට් තරග සංඛ්‍යාව සහ එක්දින තරඟ සංඛ්‍යාව කවරේද;

(iv) අපේක්ෂිත ආදායම සහ දැරීමට සිදුවන වියදම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනයේ සමස්ත මාසික වියදම කවරේද;

(ii) "ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනයේ සේවය කරන පුද්ගලයන්ගේ නම් ලැයිස්තුව සහ මසකට රු. 50,000/=ට වැඩි පාරිශ්‍රමිකයක් හෝ වැටුපක් ලබන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) "ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනයේ මාසික පොදුකාර්ය පිරිවැය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1369/'11

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්ධන නොලැබීමේ හේතුව මත කෙරවලපිටිය තාප බලාගාරයේ විදුලි උත්පාදනය නවත්වන ලද දිනය කවරේද;

(ii) ඉන්ධන ලැබ නැවත විදුලි උත්පාදනය ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කෙරවලපිටිය තාප බලාගාරයේ විදුලි උත්පාදනය නවතා දමන ලද කාල සීමාව තුළ දී ජාතික විදුලි සැපයුමට අඩු වූ විදුලි අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විදුලිය මිලදී ගත් ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනයෙන් ලබා ගන්නා ලද විදුලි ඒකකයක මිල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) යුගදනව් ආයතනය විසින් විදුලි ඒකකයක් වෙනුවෙන් අය කළ මුදල කොපමණද;

(iv) විදුලි උත්පාදනය නතර කරන ලද කාල සීමාව තුළ දී පෞද්ගලික ආයතනවලින් ලබා ගත් විදුලි ඒකක සංඛ්‍යාව සහ ඒ වෙනුවෙන් වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1395/'11

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හැටන් - දික්ඔය නගර සභා බල ප්‍රදේශයට අයත්, හැටන් නගරයේ වැසිජලය බැසයාම සඳහා මාර්ග දෙපස විධිමත් කාණු පද්ධතියක් නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් වැසිදිනවලදී හැටන් නගරයේ ජනතාව දැඩි අපහසුතාවන්ට මුහුණපාන බවත්;

(iii) ජලය බැසයෑම සඳහා විධිමත් කාණු පද්ධතියක් නොමැතිවීම නායයාමේ තර්ජනය තවදුරටත් වර්ධනය වීමට හේතුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) හැටන් නගරයේ මාර්ගය දෙපස කාණු පද්ධතියක් ඉදිකිරීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) කාණු පද්ධතියක් ඉදිකිරීම ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1668/'11

4.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ නාගරික සංවර්ධන ක්ෂේත්‍රයේ ඇති කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(ii) මෙම ව්‍යාපෘතීන් හරහා ජනතාවට ලැබී ඇති ප්‍රතිලාභ කවරේද;

(iii) ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද;

(iv) ඒවායින් බලාපොරොත්තු වන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1716/'11

5.

ගරු තිස්ස අත්තනායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් සංස්ථාව මගින් 2011 ජූනි මස ශ්‍රී ලංකාවට ගෙන්වා බෙදා හරින ලද, තත්ත්වයෙන් බාල පෙට්‍රල් මෙට්‍රික් ටොන් විසිදහස ගෙන්වීමට අනුමතිය දුන් නිලධාරීන් කවුරුන්ද;

(ii) එම බාල වර්ගයේ පෙට්‍රල් තොගය පිරවුම්හල් මගින් පාරිභෝගිකයන්ට ලබා දීමෙන් වාහනවලට සහ ඉන්ධන පිරවුම්හල්වලට සිදු වූ අලාභහානිය පිළිබඳව තක්සේරුවක් කර තිබේද;

(iii) සිදුවූ හානි පිළිබඳව ලැබී ඇති පැමිණිලි භාරසියයකට අධික සංඛ්‍යාවට අදාළව වන්දි ගෙවීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම වන්දි ලබා දෙන අයගේ නාම ලේඛනය ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1800/'11

6.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ "සැක්ස්ටන් පාර්ක්" නැමති ඉඩමට යාබදව පිහිටි ඉඩම මාතලේ මහ නගර සභාව සතු බවත්;

(ii) එම ඉඩමේ ස්වාමීන්වහන්සේ නමක් වැඩ සිටින බවත්;

(iii) එම භූමියෙහි නීති විරෝධී ක්‍රියාවන් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම නගර සභාවේ ප්‍රයෝජනයට හෝ වෙනයම් කටයුත්තක් සඳහා යෙදාගෙන තිබේද;

(ii) එම ස්ථානයෙහි ආරාමයක් ඉදිකර තිබේද;

(iii) එම භූමියේ සිදුවන නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1921/'11

7.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල, මාකඳුර කර්මාන්තපුරයේ ආයෝජන මණ්ඩලයේ අනුමත සොසේජස් කර්මාන්තශාලාවක් තිබෙන බවත්;

(ii) එහි සොසේජස් නිෂ්පාදනය සඳහා කල් ඉකුත්වූ මස් යොදා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සොසේජස් සෑදීම සඳහා එම කර්මාන්තශාලාවට කුකුළු මස් ආනයනය කරන රටවල් කවරේද;

(ii) එම කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරන සොසේජස් වර්ග අපනයනය කරන රටවල් කවරේද;

(iii) දේශීය වෙළඳපොලේ එම නිෂ්පාදනය බෙදා හරින හා අලෙවි කරන සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාකඳුර කර්මාන්තශාලාවේ සොසේජස් නිෂ්පාදනයේදී කල් ඉකුත් වූ ටෙක්ස්ටර්ඩ් සෝයා ප්‍රෝටීන් නම් අමුද්‍රව්‍ය යොදාගෙන ඇති බව දන්නේද;

(ii) එම කර්මාන්තශාලාවේ තිබී හමුවූ කල් ඉකුත් වී තිබූ එම අමු ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(iii) ලේබල් යොදා අසුරුම් කර එම කර්මාන්ත ශාලාවේ අධිශීතකරණවල ගබඩා කර තිබියදී සොයාගත් කල් ඉකුත් වූ සොසෝජස් ප්‍රමාණයයේ බර කිලෝග්‍රෑම් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) සෞඛ්‍යයට අහිතකරවන පරිදි සෝසේජස් නිපදවන එම කර්මාන්තශාලාවට එරෙහිව ගත් පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2028/’11

8.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මෙරට නොයෙකුත් ප්‍රදේශයන්හි වෙසෙන දක්ෂ නිර්මාණ ශිල්පීන්ගේ නව නිර්මාණයන්, නව සොයාගැනීම් සහ ඔවුන් විසින් නිපදවනු ලබන යන්ත්‍ර සූත්‍ර පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශක්තිමත් ආර්ථික මට්ටමක් නොමැති මෙරට නව නිපැයුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකුට තම නිපැයුම් වැඩිදියුණු කර ඉදිරියට ගෙන යැමට හැකියාවක් නොමැති බවත්;

(ii) සමාජයේ ඇති හැකි අය එම පිරිසට මූල්‍යමය උපකාර ලබා දීමට මැලිකමක් දක්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) නව නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන තුළින් මෙරට ආර්ථිකයට හා ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ නිවැරදි ඇගයීමකට ලක්කිරීමටත්;

(ii) ඒ අනුව ඵලදායි නව නිපැයුම් කළ නිපැයුම්කරුවන්ට දිරිදීම් ලබා දී එම භාණ්ඩ නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස වැඩි දියුණු කිරීමටත්;

අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0647/’10

9.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2009 ජනවාරි - මැයි කාලසීමාව තුළ රටේ සැබෑ විදේශ විනිමය හිඟයක් පැවති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) විදේශ විනිමය ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් මහ බැංකුව විසින් ඉදිරිපත් කර තිබෙන විවිධ වූ යෝජනා ක්‍රමයන්හි නම් කවරේද;

(ii) තව දුරටත් පවතින එවැනි යෝජනා ක්‍රම කවරේද;

(iii) අනේවාසික විදේශ මුදල් ගිණුම් හිමියන්ට 20% ක විශේෂ ගෙවීමක් කරනු ලැබුවේද සහ එය තවමත් ක්‍රියාත්මකද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ඉතුරුම් දිරිගැන්වීම සඳහා 2009 අය - වැය තුළින් සහ 2009 වසර මැදදී ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රම කවරේද;

(ii) ඒ වන විට ලබාදුන් පොලී අනුපාතය සහ අද පවතින පොලී අනුපාතය කවරේද;

(iii) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතුරුම් ගිණුම් සඳහා 20% ක ප්‍රසාද දීමනාවක් ලබා දුන්නේද;

(iv) එසේ නම්, එය ක්‍රියාත්මක වූයේ කවර දිනයක් දක්වාද;

(v) දැන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ආධාර ලබාදෙන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1396/'11

10\.
ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලතොට ප්‍රදේශයේ පිහිටා ඇති දංගහ ඇළ පාලම ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් දැඩි අනතුරුදායක තත්ත්වයක් ඇති වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) මේ වන විට ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1558/'11

11\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි ගඟ හරහා සෝමාවතියේ ඉදිකෙරෙන පාලම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා මුදල් වෙන් කරන ලද ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ලබා ගෙන ඇති ආයතනයේ හෝ පුද්ගලයාගේ නම සහ ලිපිනය කවරේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු අවසන් කළයුතු දිනය කවරේද;

(iii) පාලමේ ඉදිකිරීම් කටයුතුවල වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1671/'11

12\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියන් සාගරය සාම කලාපයක් කිරීම සඳහා ක්‍රියාකළ මෙරට රාජ්‍ය නායකයා හෝ නායිකාව කවුරුන්ද;

(ii) එම යෝජනාව එක්සත් ජාතීන්ගේ මණ්ඩලය වෙත ඉදිරිපත් කර සම්මත කරගන්නා ලද දිනය කවරේද;

(iii) එම යෝජනාව ක්‍රියාත්මක වීම ආරම්භවූ දිනය කවරේද;

(iv) ඉන්දියන් සාගරය සාම කලාපයක් වීම හේතුකොටගෙන ශ්‍රී ලංකාවට ලැබුණු වාසි සහ අවාසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1717/'11

13\.

ගරු තිස්ස අත්තනායක මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් කාර්යාල මගින් විවිධ සේවාවන් සැපයීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ සමග එළැඹී ඇති ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් ඇතිකර ගැනීමට ප්‍රථම ඒ සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ නීතිපතිවරයාගේ අනුමතිය ලබාගෙන තිබේද;

(iii) එම ගිවිසුම්වල කොන්දේසි කවරේද;

(iv) මෙම සේවා ගිවිසුම් මගින් තැපැල් සේවා අමාත්‍යාංශයට නියමිත පරිදි මුදල් ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1931/'11

14\.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ වරාය තුළ ගබඩා කර ඇති බහළුම්වල (කන්ටේනර්) වහල මත රැඳි ජලය මත බෝවන ඩෙංගු මදුරුවන් නිසා වරාය අසල ඇති නාවික හමුදා කඳවුරේ නිලධාරීන්ට ඩෙංගු රෝගය වැළඳී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම නාවික හමුදා කඳවුරේදී ඩෙංගු රෝගයට ගොදුරු වූ සංඛ්‍යාව කොපමණද;

(ii) 2009, 2010 සහ 2011 වර්ෂයන්හිදී එම නාවික හමුදා කඳවුරේදී ඩෙංගු රෝගය වැළඳීමෙන් මිය ගිය නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මිය ගිය එම නිලධාරීන්ගේ නම් කවරේද;

(iv) එම කඳවුර තුළ හා අවට ඩෙංගු රෝගය මර්ධනය කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2029/'11

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාවේ සිටින වයස අවුරුදු 60 ඉක්මවූ පුරවැසියන් හෙවත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිළිබඳ කිසියම් සංගණනයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම පුරවැසියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යා ලේඛන වාර්ෂිකව යාවත්කාලීන කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂිත හැඳුනුම්පතක් සකසාදීම සඳහා වූ ක්‍රමවේදයක් සැකසීමටත්;

(ii) රෝහල්වලින් ප්‍රතිකාර ගැනීම, බැංකු සේවා සහ පොදු ප්‍රවාහන සේවා වැනි පෝලිම් ක්‍රියාත්මක වන ස්ථානවලදී පෝලිමෙන් බැහැරවී එම හැඳුනුම්පත ඉදිරිපත් කිරීම මගින් තම සේවාව කඩිනමින් ලබාගැනීමේ අවස්ථාවක් ඔවුන්ට සලසා දීමටත්;

(iii) එම හැඳුනුම්පත ඉදිරිපත් කර රාජ්‍ය අංශයේ පොදු මගී ප්‍රවාහන සේවා පහසුකම් සහනදායි ගාස්තු ක්‍රමයකට ලබා ගැනීමට අවස්ථාව සලසා දීමටත්;

අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු කරු ජයසූරිය මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා වරලත් නැව් තැරැව්කරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

2.

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"චන්දිම වීරක්කොඩි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"වැලන්හින්න වාචිස්සර ජාත්‍යන්තර සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*2.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*3.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

බදු අභියාචන කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*6.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ භාණ්ඩ අපනයනය කිරීම මත සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ භාණ්ඩ ආනයනය කිරීම මත සෙස් බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2011 නොවැම්බර් 21 දිනැති අංක 1733/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,—2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 සැප්තැම්බර් 26 දිනැති අංක 1725/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2011.11.28 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*9.

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ

වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

කෘෂිකර්ම අමාත්‍යතුමා,— පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නියෝග,— 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජුලි 27 දිනැති අංක 1716/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*13.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*19.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වන) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

20.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

21.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

22.

කොටසර පියංගල රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

23.

එස්. බී. නාවින්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**